30763

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

S 5

(05) බෞද්ධ සමාජ දර්ශනය

පැ තුනයි

අතිරේක කියවීම් කාලය විනාඩි 10යි.

- I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
  සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු සමඟ අමුණා භාරදෙන්න.

විභාග අංකය : .....

පේ.ඩී.පේ.අ.
නියෝජ්‍ය විභාග
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

I කොටස

1. (i) සදිසා සමාජ සංකල්පය ඇතුළත් දීඝනිකායාගත සූත්‍ර දේශනාව නම් කරන්න. *(ලකුණු 01 යි)*

.....

(ii) සමාජයීය විද්‍යාවන් පහළ වීමට පෙර ඉපැරණි දාර්ශනිකයන් හා ආගම් කතුවරුන් විසින් අදහස් දක්වනු ලැබූ මානව සමාජයීය පැතිකඩ තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(iii) බුදුරදුන්ට ඉක්මනින් පිරිනිවන් පාන ලෙස මාරයා විසින් කරනු ලැබූ ඇරයුම ප්‍රතික්ෂේප කිරීමෙහිලා සිව්වනක් පිරිසෙහි වර්ධනය වියයුතු යැයි අපේක්ෂා කළ කුසලතා තුනක් ලියන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(iv) බුදුරදුන් දෙමව්පියන් හැඳින්වීම සඳහා භාවිත කළ ගෞරවනාම තුනක් ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(v) අග්ගඤ්ඤ සූත්‍ර විවරණයට අනුව විවට්ටමාන යුගයෙහි පෘථිවිතලයට එන ආභස්සරකායික සත්ත්වයන් තුළ විද්‍යමාන වූ ලක්ෂණ තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(vi) අදත්තාදානයෙන් වැළකීම පිළිබඳ ශික්ෂාවට අදාළ සාලෙය්‍යක සූත්‍ර විවරණයට ඇතුළත් අංග තුනක් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki

(vii) බුද්ධකාලීන භාරතයේ මිනිස් වර්ගයා විවිධ ආකාරයෙන් බෙදා දැක්වීම සඳහා බලපෑ මිතුම් (සාධක) තුනක් පෙන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

.....

(ආ) .....

.....

(ඉ) .....

.....

(viii) බුද්ධකාලීන භාරතයේ පැවති වඩාත් ප්‍රබල රාජාණ්ඩු ලෙස සැලකෙන ජනපද තුනක් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ix) බුදුසමය පෙන්වා දෙන සුරාපානයෙහි ආදීනව තුනක් ගෙනහැර දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(x) ගිහියා ආර්ථිකය සමගම වින්දනය කළයුතු සැප හතරක් අණන සූත්‍රය තුළ ඇතුළත් වේ. මේ අතරින් තුනක් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

* *

PAST PAPERS WIKI

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

S 5

(05) බෞද්ධ සමාජ දර්ශනය

● ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) සමාජ අධ්‍යයන ක්ෂේත්‍රයට සෘජුව ම සම්බන්ධ වන විෂය ඒකක හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) විද්‍යාත්මක අධ්‍යයනවල පවත්නා දැඩි ශාස්ත්‍රීය බව නිසා නොසලකා හැරෙන සාර විනිශ්චය කරුණු හයක් කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) සමාජ දර්ශනය කවරේ දැයි හඳුන්වා බෞද්ධ සමාජ දර්ශනයේ සුවිශේෂතාව විමසන්න. *(ලකුණු 08 යි)*

2. (i) බෞද්ධ සමාජය නියෝජනය කෙරෙන ශ්‍රාවක ප්‍රභේද හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) සදිසා සමාජ සංකල්පයට ඇතුළත් ඒ ඒ දිශාව නියෝජනය කෙරෙන මානව සමාජ ප්‍රභේද හය හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) පවුල් සංස්ථාව මානව සමාජයේ සෑම සංස්ථාවකට ම ආදර්ශ සපයන අයුරු සිඟාලක සූත්‍රයේ ස්වාමි-භාර්යා යුතුකම් හා වගකීම් ඇසුරින් සාකච්ඡා කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව පුද්ගලයාගේ ලෝලත්වය හා සන්නිධිකාර පරිභෝජනය සමාජ පරිණාමයෙහිලා බලපෑ අයුරු ප්‍රකට කෙරෙන ආර්ථික සාධක හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) අග්ගඤ්ඤ සූත්‍රයෙන් ප්‍රකට කෙරෙන මූලික මිනිස් ස්වභාවයන් තුනක් කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) අග්ගඤ්ඤ සූත්‍රාගත නිර්වචන තුනක් ඇසුරින් රාජ්‍ය සංස්ථාවේ ප්‍රභවය දක්වා ප්‍රජාව උදෙසා රජුගේ කාර්යභාරය විචාරයට ලක් කරන්න. *(ලකුණු 08 යි)*

4. (i) පරිසරය මානවයා වෙත ලබාදෙන මූලික අවශ්‍යතා හතරක් දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) සකල ජීව වර්ගයාට ම මෙත් වඩන අයුරු ඉගැන්වෙන කරණීයමෙත්ත සූත්‍රාගත සත්ත්ව ප්‍රභේද හයක් ගෙනහැර දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) මානව අයිතිවාසිකම් පිළිබඳ හඬනගන නූතන සමාජයට බුදුසමය ජීවහිතවාදී ඉගැන්වීම් සමුදායක් ඉදිරිපත් කරන අයුරු විචාරයට ලක් කරන්න. *(ලකුණු 08 යි)*

5. (i) මානවයා භුක්තිවිඳිය යුතු යැයි පිළිගැනෙන අයිතිවාසිකම් හතරක් ලියා දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) මානව අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මූලික දර්ශනික සංකල්ප දෙකක් ඇසුරින් කෙටියෙන් තහවුරු කරන්න. *(ලකුණු 06 යි)*

(iii) බෞද්ධ සමාජයක පඤ්චශීල ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීම තුළින් මානව අයිතිවාසිකම් තහවුරු වන බව අංගුත්තර නිකායේ ගිහි සූත්‍රය හෝ සාලෙය්‍යක සූත්‍රය ඇසුරින් විමසන්න. *(ලකුණු 08 යි)*

6. (i) බෞද්ධ ආර්ථික දර්ශනයට අනුගත ධනෝපායන වෘත්තීන් හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) බෞද්ධ ආර්ථික චින්තනයේ ධන සංරක්ෂණයට පටහැනි ධනය විනාශ කෙරෙන භෝග අපායමුඛ භය කෙටියෙන් පහදන්න. *(ලකුණු 06 යි)*

(iii) 'සමතුලිත නැණවත් ප්‍රතිපත්තියක් (සමජීවිකතා) තුළින් ආර්ථික සමෘද්ධිය ඇතිකර ගත හැකි බව බුදුසමයේ ඉගැන්වීමයි.' මෙහි සඳහන් සමතුලිත ආර්ථිකය විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

7. (i) කාමභෝගී ගෘහස්ථ ජීවිතය විනයනය කිරීමෙහිලා ගිහි විනයට අදාළ සූත්‍ර දේශනා හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) විවාහ වන යුවති-පති දෙපළ තුළ සමානව පැවතිය යුතු යැ යි බුදුසමය අගයන ගුණධර්ම හතර දක්වා, සාර්ථක විවාහ ජීවිතයකට ඒවා ඉවහල්වන අයුරු කෙටියෙන් පහදන්න. *(ලකුණු 06 යි)*

(iii) 'ස්වාමියා හා භාර්යාව අන්‍යොන්‍ය ගෞරවය හා ප්‍රේමය පදනම් කොටගෙන ගත කරන චර්යා මාර්ගය විවාහයයි.' නූතන වෛවාහික සමාජයට ලබාදෙන බෞද්ධ සදුපදේශ විචාරයට ලක් කරන්න. *(ලකුණු 08 යි)*

WWW.PastPapers.Wiki

* * *

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library